**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

**පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය**
**පශ්චාද් උපාධි අධ්‍යයනය සඳහා ලියාපදිංචි කිරීම**

# 2016 අධ්‍යයන වර්ෂය

**මෙම විශ්වවිද්‍යාලය මගින් පහත දැක්වෙන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා 2016.02.08 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.**

## 01. බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (වර්ෂ එකයි)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල

**පාඨමාලා ගාස්තුව** : රු. 13,750/-

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- කවර හෝ විෂය ධාරාවකින් සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.

  හෝ

- ඊට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගන්නා සුදුසුකම් සපුරා තිබීම.

## 02. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (වර්ෂ එකයි)

**විෂය ධාරාව** : බෞද්ධ දර්ශනය/බෞද්ධසංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/ පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : රු 30,000/-

**ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, සිංහල, පාලි, සංස්කෘත, පුරාවිද්‍යාව, සමය අධ්‍යයනය යන විෂයයන්ගෙන් විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය සමත් වීම.

  හෝ

- ඉහත සඳහන් විෂයයන් අතුරින් එක් විෂයක් සහිත ව සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.

  හෝ

- ප්‍රාචීන පණ්ඩිත උපාධිය ලබා තිබීම.

  හෝ

- විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

## 03. ශාස්ත්‍රපති දෑ අවුරුදු පර්යේෂණ පශ්චාද් උපාධි පාඨමාලාව (වර්ෂ දෙක යි)

**විෂය ධාරාව** : බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/ පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : රු. 45,500/-

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, සිංහල, පාලි, සංස්කෘත, පුරාවිද්‍යාව, සමය අධ්‍යයනය යන විෂයයන්ගෙන් ප්‍රථම පන්ති, දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයක ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ගෙන් එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම.

  හෝ

- ඉහත සඳහන් ශාස්ත්‍රපති උපාධියට හා විශේෂ ශාස්ත්‍රවේදී උපාධියට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

## 04. දර්ශනපති උපාධි පාඨමාලාව (වර්ෂ දෙක යි)

| | | |
|---|---|---|
| **විෂය ධාරාව** | : | බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/ පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය |
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **පාඨමාලාව ගාස්තුව** | : | රු.42,000/- |

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- ඉහත සඳහන් විෂය ධාරාවන්ගෙන් ප්‍රථම පන්ති, දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත සඳහන් විෂය ධාරාවන්ගෙන් ශාස්ත්‍රපති එක් අවුරුදු උපාධි පාඨමාලාවකින් සමත් වීම.

  හෝ

- මෙම සුදුසුකම්වලට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

මේ සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කරනු ලබන්නේ අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන නිබන්ධ සැලසුම් අනුමත වී සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව වේ.

## 05. දර්ශන විශාරද උපාධි පාඨමාලාව (වර්ෂ තුන යි)

| | | |
|---|---|---|
| **විෂය ධාරාව** | : | බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/සිංහල/පාලි/සංස්කෘත/ පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය |
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | : | රු. 57,000/- |

**ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

- ඉහත සඳහන් විෂය ධාරාවන්ගෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම.

  හෝ

- මේ හා සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන පශ්චාද් උපාධි සුදුසුකමක් සපුරා තිබීම.

මේ සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කරනු ලබන්නේ අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන නිබන්ධ සැලසුම් අනුමත වී සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව වේ.

**අයදුම් කළ යුතු පිළිවෙල :**

- **අයදුම්පත් ගාස්තුව රු. 500/- කි.**

i. දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත ඉදිරිපත් කර විස්තර හා අයදුම්පත් ලබා ගත හැකි ය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ii. තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට, 'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය' නමින් රු. 500/-ක් ගෙවා ලබා ගන්නා ලදුපත් සමග තම නම, ලිපිනය ලියන ලද 9''x 4'' ප්‍රමාණයේ රු. 45/- ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකිය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, 'අයදුම්පත්‍ර ලබා ගැනීම' යනුවෙන් සඳහන් කළ යුතුය.

iii. අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් රු. 500/-ක් ගෙවා ලබා ගන්නා ලදුපත සමග ඉදිරිපත් කළ යුතු ය.

**අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය 2016.01.27 වේ.**

නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2016.02.08** දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පශ්චාද් උපාධි හා බාහිර විභාග), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනයට යොමුකළ යුතුය. අයදුම්පත් **ලියාපදිංචි තැපෑලෙන්** පමණක් එවිය යුතු ය. අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා 011-2580609, 011-2502944 හා 011-2593604 දුරකථනවලින් විමසිය හැකිය.

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

**2015.12.15**